ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.

VII සභා වාරය පනස් දෙවන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.
දිනය : 2022.06.16.
වේලාව: පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:
01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
07ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි, - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
17 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය.
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.
22.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා.
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:
සහභාගී නොවූ මන්ත්‍රීවරුන් කිසිවෙක් නැත.

නිලධාරි සහභාගීත්වය:
01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ පනස් දෙවන සභාව සඳහා පැමිණි ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීනුත් සහ මාධ්‍යවේදී මහත්ම මහත්මීන් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2022.05.20. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් 2022.05.20. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

06 වන පිටුවේ යථා පරිදි කල් දී ඇති යෝජනා තීරණ අංක (05) (iv) හි "කුලී පදනම මත බැකෝ ලෝඩරය සැපයිම දිනකට"
යන සඳහන වෙනුවට
"කුලී පදනම මත බැකෝ ලෝඩරය සැපයීම පැයකට"
ලෙසට සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.
2022.06.16. වන අද දින මහා රැස්වීම පැවැත්වීමට නියමිත න්‍යාය පත්‍රයේ " රත්මලවින්න ජල යෝජනා ක්‍රමය සඳහා නව ජල මෝටරයක් මිලදී ගැනීම"
යන සඳහන වෙනුවට
"වෙලන්හින්න ජල යෝජනා ක්‍රමය සඳහා නව ජල මෝටරයක් මිලදී ගැනීම" ලෙසට සංශෝධනය විය යුතු බව ගරු සභාතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව 2022.05.20. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ වැගපිටිය කොට්ඨාසය නියෝජනය කරනු ලබන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාගේ ආදරණීය මෑණියන් අභාවප්‍රාප්ත වීම සම්බන්ධයෙන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස මාගේත්, ගරු උප සභාපතිවරයා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේත්, ලේකම්තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයේත් බලවත් ශෝකය හා කණගාටුව ප්‍රකාශ කිරිමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරනු ලබන මහජන නියෝජිතවරුන්ගේ 2021 හා 2022 වර්ෂ වලට අදාල වත්කම් හා බැරකම් ප්‍රකාශ සබරගමුව පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු සලසන ලෙසට රත්නපුර පළාත් පාලන කොමසාරිස් විසින් දන්වා එවා තිබෙනවා. එබැවින් ලේකම්තුමිය විසින් ලබා දෙනු ලබන පොර්මය කඩිනමින් සම්පූර්ණ කර නැවත ලේකම්තුමිය වෙත ලබා දීමට පියවර ගන්න.

(iii). එක රටක් එක නීතියක් සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත තොරතුරු ලබා ගැනීම සඳහා 1948 වර්ෂයේ සිට මේ දක්වා ඉඹුල්පේ පළාත් පාලන ආයතනයට අදාල ගම් වීදි, මාර්ග හා නගරවල නම් සංශෝධනයක් වී ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට පියවර

ගන්නා ලෙස දන්වා එවා තිබෙනවා. එ් සම්බන්ධයෙන් ඔබතුමන්ලා සතුව පවතින තොරතුරු ලේකම්තුමියට ලබා දෙන්න.

(iv). කාරක සභා පත් කිරීම හා විෂය පථය පැවරීම, ටෙන්ඩර් මණ්ඩලය පත් කිරීම සිදු කරනු ලබන්නේ මහ සභාව විසිනි. එසේ පත් කරනු ලබන කමිටුවලට ඉදිරිපත් කරනු ලබන යෝජනා සහ වාර්තා එම කමිටු අනුමැතියෙන් අනතුරුව, මහ සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේ දී එහි අන්තර්ගත කරුණු පිළිබඳව සභාව යම් දැනුවත් වීමත් විය යුතුය යන පදනම මත සිටිමින් කාලය කළමකරණය කිරීම සඳහාත්, අධ්‍යයනයේ පහසුව සඳහාත් එම කමිටු වාර්තා මන්ත්‍රීවරුන් වෙත ලබා දීමට කටයුතු කලත් එම ලබා දීම් සභා රීති අනුව අනිවාර්ය නොවේ. එහෙත් ඕනෑම විටෙක එම කමිටු වාර්තා මනිත්‍රීවරුන් වෙත ලබා දීම සිදු කල හැකි අතර මේ දිනවල රටතුල පවතින ආර්ථික තත්ත්වය, මුද්‍රණ ද්‍රව්‍ය සහ කඩදාසි හිඟයක් පවතින බැවින් එම තත්ත්වයන් සැළකිල්ලට ගෙන එයට විසඳුමක් ලෙස සියලු කමිටු වාර්තා මන්ත්‍රීවරුන් වෙත WhatsApp හෝ Email මඟින් ලබා දීමට පියවර ගන්නා බව දන්වා සිටිනවා.

## (03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) උප වගන්තිය ප්‍රකාරව ජාතික විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් එම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ හා මුදල් පොදුවේ පිළිගත් ගිණුම්කරණ වලට අදාල අනුකූල සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළබිඹු කරන බව විගණකාධිපතිගේ මතය බව දන්වා එවා තිබෙන බව ප්‍රකාශ කරමින් එම වාර්තාව සභාගත කරමින්, සභාවට එම මතය ලබා ගැනීම සම්බන්ධයෙන් ක්‍රියා කල සියළුම නිලධාරීන්ට ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවද ප්‍රකාශ කරන ලදි.

(04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.
(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව සතු සියලුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා 2022 වර්ෂයේ ජනවාරි සිට මැයි මස දක්වා වැය වූ ඉන්ධන ප්‍රමාණයන්ට අදාල සාරාංශය මහ සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් පසුගියවර මාසික මහ සභා රැස්වීම් වාරයේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමාගේ ඉල්ලීම පරිදි මෙම තොරතුරු ඉදිරිපත් කල බවත් මේ පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා ඉදිරිපත් කළ තොරතුරු සම්බන්ධයෙන් දරණ මතය සභාවට ඉදිරිපත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
එක් එක් මාසයන්ට අදාලව ඉදිරිපත් කල තොරතුරු සංසන්දනය කළා. ඒ අනුව ඉන්ධන පරිභෝජනය කිරීම පිළිබඳව වර්ධනය වීමක් දක්නට නැහැ. පොදුවේ සභාව විසින් ඉන්ධන පරිහරණය කිරීමේ දී අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කර තිබීම සතුටට කාරණයක්. අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම පිළිබඳව මාගේ ස්තුතිය පිරිනමනවා.

## (05). යථා පරිදි කල් දී ඇති යෝජනා.

(i). ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කර ඇති ජල සම්පාදන ව්‍යාපෘතියට සමගාමීව අප ප්‍රාදේශීය සභාවේ පඹහින්න ජල ව්‍යාපෘතිය මඟින් ජල සම්බන්ධතා ලබා දී ඇති ජල පාරිභෝගිකයන් ද සිටින බව අපගේ ඉල්ලීම පරිදි එම ආයතනය විසින් එවන ලද ලිපියෙන් හඳුනාගත් බවත්, ඒ අනුව ප්‍රාදේශීය සභාව හා ජාතික ජල සම්පාදන මණ්ඩලය සමඟ ඇතිකරගත් එකඟතාවය පරිදි පඹහින්න ප්‍රදේශයේ ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය මඟින් ජල සැපයුම් ලබා දී ඇති සහ සභාවේ පඹහින්න ජල ව්‍යාපෘතිය මඟින් ජල සම්බන්ධතා ලබා දී ඇති ජල සම්බන්ධතා විසන්ධි කිරීමට අදාලව

ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින්, මෙහිදී ජල යෝජනා ක්‍රම දෙකෙන්ම ජල සම්බන්ධතා ලබා ගන්නා පාරිභෝගිකයන් සිටින බැවින්, සභාවේ ජල සම්බන්ධතා විසන්ධි කොට, එක් ජල යෝජනා ක්‍රමයකින් හෝ ජල සම්බන්ධතා ලබා ගැනීමට නොහැකි වූ ඉල්ලුම්කරුවන්ට නව ජල සම්බන්ධතා ලබාදීමට කටයුතු කරන බව ද ප්‍රකාශ කරන ලදි.

ජල යෝජනා ක්‍රම දෙකෙන්ම ජල සම්බන්ධතා ලබාගෙන ඇති ජල පාරිභෝගිකයන්ගෙන් ප්‍රාදේශීය සභාව මඟින් ලබා දී ඇති ජල සම්බන්ධතාවය විසන්ධි කොට, එම ජල සම්බන්ධතා නව ජල ඉල්ලුම්කරුවන් වෙත ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව ජල යෝජනා ක්‍රම දෙකෙන්ම ජල සම්බන්ධතා ලබාගෙන ඇති ජල පාරිභෝගිකයන්ගෙන් ප්‍රාදේශීය සභාව මඟින් ලබා දී ඇති ජල සම්බන්ධතාවය විසන්ධි කොට, එම සම්බන්ධතා නව ජල ඉල්ලුම්කරුවන් වෙත ලබා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් වෙලන්හින්න ජල යෝජනා ක්‍රමයෙන් ජල පාරිභෝගිකයන්ට අඛණ්ඩව ජල සැපයුම් ලබා දීමේ දී එහි දැනට පවතින ජල මොටරය දීර්ඝ කාලයක් සේවයේ යොදවා ඇති බැවින්, නිරන්තර බිඳවැටීම් සිදුවන බැවින්, නියමිත කාර්යක්ෂමතාවයකින් නොපවතින බැවින්, ජල පොම්පය අළුත් වැඩියා කරනු ලබන නියෝජිත ආයතනයට යොමුකර පරික්ෂා කර බලා අළුත් වැඩියා කිරීම හෝ නව ජල මෝටරයක් මිලදී ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවින් වෙලන්හින්න ජල යෝජනා ක්‍රමය සඳහා නිෂ්පාදිත ආයතනයෙන් කඩිනමින් නව ජල මෝටරයක් මිළදී ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවින් වෙලන්හින්න ජල යෝජනා ක්‍රමය සඳහා නිෂ්පාදිත ආයතනයෙන් කඩිනමින් නව ජල මෝටරයක් මිළදී ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(iii). සමනල වැව ජලාශයේ වැව් බැම්මේ ජල කාන්දුව අසල ප්‍රදේශය පුරා කැළිකසළ ඉවත් කිරීමේ ව්‍යාපෘතියක් ව්‍යවහාරික විද්‍යාපීඨ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මූලිකත්වයෙන් දියත් කිරීමටත් ඒ සඳහා කසළ බඳුන් ලබා දෙන ලෙසත්, සමනල වැව ජලාශය හා එහි පාරිසරික වටිනාකම දක්වමින් " නිසි ලෙස කැලිකසළ බැහැර කරමු. පරිසරය සුරකිමු " යනුවෙන් දැනුවත් කිරීමේ දැනුවීම් පුවරුවක් සවි කිරීම සඳහාත් සහයෝගය ලබා දෙන ලෙසත් ඉල්ලමින් ව්‍යවහාරික විද්‍යාපීඨ සංගමයේ සභාපති විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.
නැවතත් ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
මෙම ස්ථානය අසලින් ගමන් කරනු ලබන්නන් විසින් කැලිකසළ අවිධිමත් පරිදි බැහැර කිරීම නිසා ප්‍රදේශය අවට අපවිත්‍රව පවතිනවා. විධිමත් පරිදි කසළ බැහැර කිරීම සඳහා විශ්ව විද්‍යාලයේ පරිසර කමිටුව හා ප්‍රාදේශීය සභාව එක්ව සිදු කරනු ලබන ව්‍යාපෘතියක් ලෙස එම ස්ථානයේ කසළ බඳුන් ස්ථාපිත කිරීමටත්, එහි නඩත්තු කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභාවට අමතර පිරිවැයක් දැරීමට සිදුවන බැවින්, සිසුන් විසින් එම ස්ථානය පිරිසිදු කරනු ලබන දිනට සභා ට්‍රැක්ටර් රථය ලබා දී කසළ ලබා ගැනීමටත් කටයුතු කල හැකි බව දැනුම් දුන් බව ප්‍රකාශ කරන ලදි.

විධිමත් පරිදි කසළ බැහැර කිරීම සඳහා එම ස්ථානය තුල දැන්වීම් පුවරුවක් සවි කිරීමටත් ඒ සඳහා සභා අරමුදල් දැරීමටත් සිසුන් විසින් එම ස්ථානය පිරිසිඳු කරනු ලබන දිනයට සභාවේ ට්‍රැක්ටර් රථය මඟින් කසළ ලබා ගැනීමත් සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව විධිමත් පරිදි කසළ බැහැර කිරීම සඳහා එම ස්ථානය තුල දැන්වීම් පුවරුවක් සවි කිරීමටත් ඒ සඳහා සභා අරමුදල් දැරීමටත් සිසුන් විසින් එම ස්ථානය පිරිසිදු කරනු ලබන දිනයට සභාවේ ට්‍රැක්ටර් රථය මඟින් කසළ ලබා ගැනීමේ යෝජනාට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(iv). සභා බල ප්‍රදේශය තුල කසළ බැහැර කිරීම විධිමත් කිරිම, පරිසරය පවිත්‍රව හා අලංකරණයෙන් යුතුව පවත්වාගෙනයාමේ දී ර/ ශාරිපුත්‍ර විද්‍යාලය අසල කසළ බඳුන් ස්ථාපිත කිරීමට පියවර ගත් අතර, මාර්ගයේ වාහන මඟින් ගමන් කරන්නන් විසින් මෙම කසළ බඳුන් තුලට කසළ බැහැර කිරීම හේතුවෙන් එය පාසලේ පරිසර අලංකරණයට බාධාවී ඇති බැවින් එම කසළ බඳුන් වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපිත කිරීමට අදාලව ර/ ශාරිපුත්‍ර විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

එම කසළ බඳුන් එම ස්ථානයෙන් ඉවත් කර පාසල තුල ස්ථාපිත කිරීම සඳහා ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථර කරන ලදි.

ඒ අනුව ර/ ශාරිපුත්‍ර විද්‍යාලය අසල ස්ථාපිත කරන ලද කසළ බඳුන් එම ස්ථානයෙන් ඉවත් කර පාසල තුල ස්ථාපිත කිරීම සඳහා ලබා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

### (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද මැයි මස 01 වන දින සිට මැයි මස 31 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 70 සහ වවුචර් අංක 391 සිට 470 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන 2022.06.03. වන දින පැවැති මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී .

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව මුදල් කමිටු අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

### (06). (ii). ටෙන්ඩර් මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම.

2022.06.03. දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,

01. ප්‍රධාන කාර්යාලයේ එදිනෙදා පාවිච්චිය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
02. ප්‍රධාන කාර්යාලයේ මුද්‍රණ කටයුතු සඳහා අවශ්‍ය ටෝනර් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
03. ප්‍රාදේශීය සභාවේ වීථි පහන් හා උපකරණ ගබඩා කිරීම සඳහා ස්ථානයක් සකස් කිරීමට හා සවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම.
04. ප්‍රාදේශීය සභා Power wx 7000 petrol විදුලි ජනක යන්ත්‍රය අළුත් වැඩියා කිරීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමට අදාල වූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සහා අනුමැතිය සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව.

2022 මැයි මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## (08). වෙනත් කරුණු.

(i). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
මාගේ ආදරණීය මෑණියන් පසුගිය දින අභාවප්‍රාප්ත වුණා. එම අවස්ථාවේදී රෝහලේ සිට මෘත දේහය මිහිදන් කරන අවස්ථාව වන තුරු ගරු සභාපතිතුමා පැමිණ විශාල සහයෝගයක් ලබා දුන්නා. සහභාගී වීම සහ නන් අයුරින් සහයෝගය ලබාදීම වෙනුවෙන් ගරු සභාපතිතුමාට, ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටත් ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.
සහල් අලෙවි කරන්නන් රු. 185 ට, රු.195 ට සහල් මිලදී ගෙන එම සහල් රු. 260 ට 270 ට පාරිභෝගකයන්ට අලෙවි කරනු ලබයි. ජනතාව පීඩනයට පත් වන අයුරින් හාල් මාපියාවක් සිදු වී එමඟින් වෙළඳ මහතුන් තම ආදායම් තරකර ගත්තා. ජනතාවට අත්විඳීමට සිදුවන මෙවැනි පීඩනයන් හේතුවෙන් සමාජය තුල පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ව හෙළා දකිනවා. වෙළඳ බලපත්‍ර නිකුත් කර සභාවට බඳු අය කරන බැවින් මේ පිළිබඳව සොයා බැලීමට කටයුතු කල යුතුයි. භූ විෂමතා සහ ආර්ථික විෂමතා අනුව 1987, 1988 වැනි වර්ෂ වල සකස් කරන ලද නීති වර්තමානයට කාලෝචිත නොවන බැවින් ජනතාවට සහනයක් වන ලෙස එම නීති නැවත ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කල යුතුයි. පාරිභෝගික සේවා අධිකාරියෙන් නිසි ලෙස විමර්ශන සිදු නොකිරීම ගැටලු සහගතයි.
කෘ.ප.නි.ස. නිලධාරින් සිය ක්ෂේත්‍ර රාජකාරිවල නොයෙදන බවත්, කෘෂි කාර්මික කටයුතු සඳහා ඔවුන්ගෙන් ලැබිය යුතු උපදෙස් නොළැඹෙන බවත්, ග්‍රාම නිලධාරීන් විසින් ඡන්ද හිමි නාම ලේඛනය පවා නිසි පරිදි බෙදා නොහරින බවත් ගම්වාසීන් චෝදනා කරනවා. සමෘද්ධි නියාමකවරුන් ආර්ථික වශයෙන් වත්කම් තිබෙන අයට සමෘද්ධි දීමනාව ලබා දීලා. මෙවැනි හේතූන් නිසා ජනතාව පිඩිත වන බැවින්, එම පීඩනයන් දේශපාලඥයා මතින් පිට කරනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙපලක් බලංගොඩ ප්‍රදේශය නියෝජනය කරන බැවින් ඔවුන් හරහා සමෘද්ධි දීමනාව ලබා දීමේ මෙවැනි අක්‍රමිකතා පිළිබඳව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරමු. එමෙන්ම දිගින් දිගටම සහනාධාර ලබා දිය යුතු රටක් නොවන නිසා එම දීමනා ලබන්නන්ගේ ආදායම් තත්ත්වය වැඩි කිරිමට කටයුතු කර සහනාධාර දීමනාව ලබා දිය යුතු අඩු ආදායම්ලාබීන් අඩු කල යුතුයි. වසරක් තුල ආදායම් තත්ත්වය ඉහළ දමන්නන් වැඩි කිරීම පිළිබඳව සමෘද්ධි නියාමකවරුන්ට ඉලක්කයක් සපයා දිය යුතුයි. එම ක්‍රමවේදය ජාතික මට්ටමින් ක්‍රියාත්මක විය යුතු බැවින් බලංගොඩ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙපල මඟින් ඒ පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කරමු.

(ii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාගේ මවගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය හා කණගාටුව ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර, ඒ පිළිබඳව දැන ගැනීමට හැකියාවක් නොළැබුණු බැවින් සහභාගී වීමට නොහැකි වුණා. එබැවින් ඉදිරියේ දී මෙවැනි අවස්ථාවන් පිළිබඳව කෙටි පණිවුඩයකින් හෝ මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

රජය විසින් කෘෂි කාර්මික කටයුතු පවත්වාගෙන යාම සඳහා පොහොර සහනාධාරය ලබා දුන්නත් එම පොහොරවල වැලි, පස් සහ ගල් අන්තර්ගත වී තිබුණා. සභාව විසින් නිෂ්පාදනය කරනු ලබන ප්‍රමිතියෙන් යුතු පොහොර ප්‍රදේශය තුල පිහිටි ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත අලෙවි කිරීමෙන් අනතුරුව, ප්‍රදේශයේ ගොවි ජනතාවට එම පොහොර බෙදා හැරීමට හැකි ක්‍රම වේදයක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

(iii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දක්වමින්,
අමුවතුගොඩ ග්‍රාමනිලධාරි වසමේ පිහිටි සදාහරිත වැව්ලි සමාගමට අයත් අක්කර 44 කින් යුතු භූමියක සුදු හඳුන් වගා කලත් එම වගාව අසාර්ථක වීම නිසා කහවත්ත ප්‍රදේශයේ එම වගාව නැවත ආරම්භ කර ඇති බව දැනගැනීමට හැකිවුණා. කැළැ වැවී ඇති මෙම භූමි භාගය නිසා වනසතුන් ගම්වැදීම වළක්වා ගැනීම හා වන සතුන්ගෙන් අනෙකුත් වගාවන්ට වන හානිය වළක්වා ගැනීම සඳහාත්, මෙම ඉඩම රටට ප්‍රයෝජනවත් ලෙස භාවිතා කිරීම සඳහාත් අදාල සමාගම දැනුවත් කිරීමට පියවර ගනිමු.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාගේ මවගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය හා කණගාටුව ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර, ඒ පිළිබඳව දැන ගැනීමට හැකියාවක් නොලැබුණු නිසා සහභාගී වීමට නොහැකි වුණා. එම නිසා ඉදිරියේ දී මෙවැනි අවස්ථාවන් පිළිබඳව දුරකතන ඇමතුම් මඟින් මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

එම අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාගේ මවගේ අභාවය පිළිබඳව පණිවුඩය මන්ත්‍රීවරුන් වෙත ලබාදීමට කාර්යාල සේවකයෙකුට උපදෙස් ලබාදුන් බවත්, එම පණිවුඩය මන්ත්‍රීවරුන් වෙත නොලැබීමට හේතුව විමසා බැලීම සඳහා, ගරු සභාපතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

එම සාකච්ඡාවෙන් අනතුරුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමාගේ සහ ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

කාරක සභා අවස්ථාවේ දී,
දුරකතන ඇමතුම් ලබා දුන්නත් කීප දෙනෙකු දුරකතනයට ප්‍රතිචාර නොදැක් වූ බවත්, දුරකතන අංක ක්‍රියාවිරහිතව පැවතීමත් හේතුවෙන් සියලු දෙනාටම තොරතුරු ලබා දීමට නොහැකි වූ බව ප්‍රකාශ කල බැවින්, එම අවස්ථාවේ දී මන්ත්‍රීවරුන් සඳහා WhatsApp මඟින් තොරතුරු ලබා දීමට ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය ප්‍රකාශ කිරීමත් සමඟ, ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් සඳහා WhatsApp සමාජ මාධ්‍ය ජාලය හරහා මන්ත්‍රී සංසදයක් පවතින බවත් ඒ ඔස්සේ තොරතුරු හුවමාරු කර ගන්නා බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරමින් සියලු දෙනාගේම ක්‍රියාකරන දුරකතන අංක සහ කාර්යාලයට ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

(iv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් උඩවෙල වෙද මාවත කොන්ක්‍රීට් කර මාර්ගය සංවර්ධනය කර තිබුණත්, එම මාර්ගයේ ඉවුර කඩාවැටීම වැළැක්වීම සඳහා පැති බැම්මක් ඉදිකරන ලෙසට, කළණසිරි වෙද මහතා විසින් ගරු සභාපතිතුමාට ලිපියක් යොමු කරමින් එහි පිටපත් මා වෙත ද යොමු කර තිබුණා. ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගය කුමක් ද?
ප්‍රාදේශීය සභාවට අයත් පඹදෙනිය මාර්ගයේ ඇති පාලමේ අත්තිවාරම ගැලවී යමින් පවතින බැවින්, ගංවතුර අවස්ථාවන්වලදී එම ප්‍රදේශයට විශාල හානියක් සිදු විය හැකි නිසා ඊට පෙර මාර්ගය ප්‍රතිසංස්කරණය කල යුතුයි. මෙම මාර්ගය පිළිබඳව පළාත් සභාව දැනුවත් කළත් තීන්දුවක් නැහැ. තව දුරටත් මාර්ගය අවධානම් සහගත තත්ත්වයක් පවතින බැවින් මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.
කැපොක්වත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය නිරීක්ෂණය සඳහා සහභාගී වුණා. එහි විශාල කසළ ප්‍රමාණයක් ගොඩගසා තිබුණත් කසළ දැමීමට වළක් දක්නට ලැබුණේ නැහැ. පළාතම දුර්ගන්දය හමනවා. අපද්‍රව්‍ය පිළිස්සීම තහනම් වුවත් කම්කරු මහතුන් විසින් පොලිතින් සහ ප්ලාස්ටික් පුළුස්සනු දක්නට ලැබුණා.

මෙමගින් පිළිකාකාරක පැතිරෙන අතර වායු දූෂණය, ජලයට විෂ මුසු වීම, දුමාරය පැතිරීම නිසා ස්වසන රෝග පවා ඇති විය හැකි බැවින් මේ පිළිබඳව දැඩි අවධානය යොමුකර මේ තත්ත්වය වළක්වාගැනීමට කඩිනම් පියවර ගන්නා ලෙසට ඉල්ලා සිටිනවා.

(v). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින්,
මීට දින කිහිපයකට පෙර හතරබාගේ සහ තුංකිඳ ප්‍රදේශවලට වනඅලි ගම්වැදීමත් සමඟ එම වනඅලි තර්ජන උග්‍රවී පවතියි. ගම්වැදුණු නිවෙස් පවා කඩා බිඳ දමා තිබෙනවා. මේ පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවටත්, එමගින් දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවටත් ඉදිරිපත් කළා. එහිදී අලිවැට ඉදි කිරීම සඳහා යෝජනා සහ ක්‍රමවේද සකස් කර තිබුණත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාල ගැටලුවක් හේතුවෙන් යෝජිත අලිවැට ඉදිකිරීම අතර මඟ නැවතිලා. මේ ප්‍රදේශයේ රක්ෂිතය වටා තේවතු පිහිටා ඇතත්, ගම්වාසීන් දෛනිකව එම නිෂ්පාදන කටයුතුවල නිරත වීමට බියක් දක්වයි. එම නිසා කඩිනමින් අලිවැට ඉදිකිරීම සම්බන්ධව අදාල බලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරමු.

(vi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා අදහස් දක්වමින්,
අහිංසක ජනතාව දැඩි පීඩනයට පත්වන අයුරින් පාරිභෝගික වෙළඳ භාණ්ඩ වැඩි මිළට විකුණනු ලබන කළුකඩ මුදලාලිලා පිළිබඳව සොයා බලා කටයුතු කලහැකි නම් එය ඉතා වැදගත් යෝජනාවක්.
ප්‍රාදේශීය සභා පෙර පාසලේ අබලන් වූ උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා පසුගිය මස මන්ත්‍රී ප්‍රතිපාදන පරිත්‍යාග කළත් එම මුදල් ප්‍රමාණවත් නොවන බව දැන ගැනීමට ලැබුණා. ඒ සඳහා අවශ්‍ය ඉතිරි මුදල් ද පරිත්‍යාග කිරිමට කටයුතු කරන බව සතුටින් දන්වා සිටිනවා.

(vii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
රජය තුළ ඇති වී ඇති ආර්ථික අපහසුතා හේතුවෙන් සභා බල ප්‍රදේශයේ සංවර්ධනය කරමින් පැවැති මාර්ගවල සංවර්ධනය කටයුතු අතර මඟ නතර වෙලා. මේ නිසා සංවර්ධනය කරන ලද කොටසත්, සංවර්ධනය කිරිමට නියමිත කොටසත්, සෝදා පාලුවට ලක් වීම නිසා විනාශයට පත් වෙමින් තිබෙනවා. එබැවින් කඩිනමින් එම මාර්ග සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට අදාල ආයතන දැනුවත් කරමු.

(viii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ අදහස් දක්වමින්,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වගා නොකරන ලද ඉඩම් කොටස්වල ආර්ථික අපහසුතා උග්‍රවීම හේතුවෙන් ගම්වාසීන් වගාකටයුතු නිරත වෙමින් සිටිනවා. කෘෂි කාර්මික කටයුතු සඳහා ඉඩම් නොමැති ජනතාව රජයෙන් තාවකාලිකව වගා කිරීම සඳහා ඉඩම් කොටස් ඉල්ලුම් කරන බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරමු.

සභා බල ප්‍රදේශයේ සංවර්ධනය කිරීමට නියමිත, ගිවිසුම් අත්සන් කරන ලද මාර්ගවල සංවර්ධන කටයුතු අතරමඟ නවතා දමා තිබෙනවා. මාර්ග නඩත්තු කටයුතු සිදු වන්නේ නැහැ. සංවර්ධන කටයුතු අතරමඟ නවතා දමා ඇති මාර්ග සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලෙසට අදාල බලධාරීන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාගේ මවගේ අභාවය සම්බන්ධව පවුලේ ඥාතීන් වෙත ශෝකය හා කණගාටුව ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

(ix). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
වැගපිටිය ග්‍රාම නිලධාරි වසමේ කිංස්පාර්ක් ගම්මානයේ ගම්බඳ ප්‍රදේශ ආවරණය වන පරිදි 1982 වර්ෂයේ දී පෞද්ගලික ඉඩම් මැදින් හා ගැසට් කර නොමැති මාර්ග හරහා විදුලි රැහැන් පද්ධති ස්ථාපිත කර තිබේ. මේ වන විට එම ප්‍රදේශ විශාල ජනාවාස බවට පත්වීම, යටිතල පහසුකම් දියුණුවීම, නව නිවාස හා ගොඩනැගිලි ඉදිවීම නිසා මෙම විදුලි රැහැන් පද්ධති ජන ජීවිත වලට තර්ජනයක් වී ඇති බැවින්, කිංස්පාර්ක් ගම්මානයෙන් ආරම්භවී උඩනළුවෙල කුඹල්මුල්ල මාර්ගයෙත්, උඩනළුවෙල යාය මාර්ගයේ සිට උඩගංගොඩතැන්න දක්වා දිවෙන මාර්ග අසලින් තෙකලා විදුලි රැහැන් පද්ධති ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට විදුලි අධිකාරි දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසට ඉල්ලා සිටිනවා.

අමුපිටිය ග්‍රාම නිලධාරී වසමේ සමනල ගම ප්‍රදේශයේ නාවල කුඹුරු යායේ පුරන් වූ කුඹුරු යළි අස්වැද්දීමේ ක්‍රියාවලියේ දී එම කුඹුරු සී සැම සඳහා අත්ට්‍රැක්ටරයක් රැගෙන යාම සඳහා මාර්ගයක් නොමැතිකම ගැටලුවක්. එම ප්‍රදේශයේ අඩවි වන නිලධාරී කාර්යාලය දෙපස මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් පවතින බැවින් එම ඉඩම් තුලින් අත්ට්‍රැක්ටරයක් රැගෙන යාම සඳහා මාර්ගයක් සකස් කර දෙන ලෙසට රත්මලවින්න ප්‍රාදේශීය සංවර්ධන නිලධාරිතුමා මඟින් ඉල්ලීම් කර මාර්ගය ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථාව සකසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

සමෘද්ධි සහනාධාරය ලබා දීමේ දී කිංචිගුණේ ප්‍රදේශයේ මෝටර් රථ ඇති දෙදෙනෙකුට රු. 5000.00 දීමනාව ලබා දී තිබුණා. වඩාත් පීඩිත ජනතාව බල ප්‍රදේශය තුල සිටින බැවින් ඔවුන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කර විධිමත් පරිදි දීමනාව ලබා දීමට කටයුතු කල යුතුයි.

පඹහින්න ස.තො.ස. මඟින් සීනී මිලදී ගැනීමට පෝලිමේ සිටි ජනතාවගෙන් ඉදිරිපෙළේ සිටි සිව් දෙනෙකුට පමණ රු.178 කට සීනි විකුණා ඇතත්, පඹහින්න ස.තො.ස. කළමණාරුට ඉහළ නිලධාරියෙකුගෙන් ලද දුරකතන ඇමතුමක් මත, පෝලිමේ පසුපස සිටි අයට රු. 242.00 ට සීනි විකුණා ඇති බවට, අක්‍රමිකතාවයක් වාර්තා වුණා. එසේ අක්‍රමිකතා සිදු නොවිය යුතුයි.

කොට්ඨාශය තුල ජීවත්වන්නන්ගේ ප්‍රශ්න සොයා බැලීමේ දී ඒ සඳහා ගමන් කිරිමට මන්ත්‍රීවරුන්ට ඉන්ධන දීමනාව හිමි වුවත්, බල ප්‍රදේශය තුල ඉන්ධන හල් දෙකක් ස්ථාපිතව තිබුණත් මන්ත්‍රීවරුන්ට ඉන්ධන ලබා ගැනීමට හැකියාවක් නැහැ. මේ පිළිබඳ අවධානය යොමුකර සභාව මැදිහත් වී ඉන්ධන ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

මෙම ප්‍රකාශයත් සමඟ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමාත් නැගී සිටිමින් සභාව මැදිහත් වී මන්ත්‍රීවරුන්ට හිමි ඉන්ධන දීමනාවට සරිලන ඉන්ධන ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

(x). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා අදහස් දක්වමින්,

පිඩලිගන්නාවෙල නියදිහෙල පාලමේ පැති බැම්ම ගැලවියාම නිසා මද්දේගම හා පිඩලිගන්නාවෙල වසම් වල ජනතාව දැඩි අපහසුතාවයට පත් වෙලා. කිතුල් කොට, උණ කොට දමා ප්‍රදේශයේ ජනතාව තාවකාලිකව පාලම සකස් කරන අවස්ථාවේ දී කොට්ඨාශය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරයා ලෙස මමත් සහයෝගය ලබා දුන්නා. මේ පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී වලේබොඩ මැතිතුමාට දැනුම් දුන්නා. ප්‍රාදේශීය සභාවට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දුන්නා. එම නිලධාරින් පැමිණ ඡයාරූප සහ වාර්තා රැගෙන ගියත්, මම ආණ්ඩු පක්ෂය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරයෙක් වුවත්, පාලම ප්‍රතිසංස්කරණය කරවා ගැනීමට නොහැකි වුණා. ඒ පිළිබඳව මා දැඩි කණගාටුවට පත් වෙනවා. මෙම ප්‍රදේශයේ කුඩා ජල විදුලි බලාගාර දෙකක් ඉදි කර තිබෙන නිසා එහි ජලය විවෘත කරන අවස්ථාවල්වලදීත්, වර්ෂා කාලයටත් මෙම ස්ථානය ඔස්සේ ගමන් කිරිම ජන ජීවිත අවදානමේ හෙළීමකි. කෘෂි නිෂ්පාදන රැගෙන යාමට, පාසලට, රෝහලට, පන්සලට ගමන් කිරීමට ඇති එකම මාර්ගය මෙයයි.

පඹගොල්ල, මද්දේගම, අස්වැද්දුම, උඩගම හේන්යාය, හෝනමුල්ල ගම්මාන වල ජීවත්වන හා කෘෂි නිෂ්පාදන වෙළලද පොලට සපයනු ලබන, එම ජනතාවට ගමන් කිරීමට තිබෙන එකම මාර්ගයේ වසර ගණනාවකට පෙර ඉදි කරන ලද පාලම ගැලවී ගියා. සභාවේ කාර්මික නිලධාරී මහතා එම ස්ථානය පරීක්ෂාවට ලක් කළා. ඡායාරූප හා වාර්තා රැගෙන ආවත් ඒ පිළිබඳව සාකච්ඡා කර නැහැ. ඒ අනුව එකම මාර්ගයේ ඉදිකර තිබුණු පාලම් දෙකම ගැලවී යාම නිසා දැඩි අපහසුතාවයට පත්ව සිටියි. එබැවින් මෙම ගම්මාන දෙක තුල ජීවත්වන අහිංසක ජනතාව සහනයක් ලෙස එක් පාලමක් හෝ ඉදිකර දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ඉල්ලා සිටිනවා.

(xi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින්,

බලංගොඩ වැවිලි සමාගම සතුව කැපොක්වත්ත, ඕලුගංතොට වැනි විශාල වතු ප්‍රමාණයක් පැවතියත් එම වතු කැළැවැවී මුඩුබිම් බවට පත්ව තිබෙනවා. මෙම වතු වසර 66 ක, 99 ක කාල සඳහා බඳු දී ඇති අතර එවැනි ඉඩම් රජයට පවරාගෙන ජනතාවට කෘෂි කාර්මික කටයුතු සඳහා ලබා දියයුතුයි. ඉදිරියේ දී ඇති වීමට නියමිත ආහාර හිඟයට විසඳුමක් ලෙස වතුජනතාවට වගා ද්‍රව්‍ය දුන්නත් වගා කිරිමට සුදුසු බිම් කොටස් නැහැ. ඔවුන්ට

නිවාස ඉදිකර ගැනීමට ඉඩම් නැහැ. එම නිසා කැළෑ වැවී ඇති ඉඩම් කොටස් ජනතාවට ලබා දීමට සුදුසු වැඩ පියවරක් ක්‍රියාත්මක කළ යුතුයි.
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් කොටස් වල තාවකාලික බෝග වගාකිරිම සඳහා ගම්වාසීන් කටයුතු කරමින් සිටින අතර රජයට අයත් ඉඩම් කෘෂි නිෂ්පාදන සඳහා ලබා දෙන ලෙසට ඉල්ලීම් කරනවා. මේනිසා ඉදිරියේ දී ඇතිවීමට නියමිත ආහාර හිඟයට විසඳුමක් ලෙස කැළෑ වැවී ඇති ඉඩම් කොටස් ජනතාවට ලබා දීමට අදාල මෙම යෝජනාව බලංගොඩ නියෝජනය කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙපල මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර විසඳුමක් ලබාගැනීමට පියවර ගනිමු.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ජී සමන්ත ජයසිංහ මැතිතුමාගේ මවගේ අභාවය සම්බන්ධව පවුලේ ඥාතීන් වෙත ශෝකය හා කණගාටුව ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර දානමය පිංකම සඳහා සහයෝගය ලබා දීමට කටයුතු කරමු.

(xii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ජී සමන්ත ජයසිංහ මැතිතුමාගේ මවගේ අභාවය සම්බන්ධව පවුලේ ඥාතීන් වෙත ශෝකය හා කණගාටුව ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

(xiii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ජී. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා සභාව නියෝජනය කිරීම පිළිබඳව සතුටට පත්වන අතරම එතුමාට සුභ පැතුම් එක් කිරිමට මෙය අවස්ථාවක් කර ගන්නවා.
පසුගිය 09 වෙනිදා රට තුල ප්‍රශ්න රාශියක් සිදු වුණා. බලංගොඩ උද්ඝෝෂණ රැලි හතරක් පැවැත්වුණු අතර පසුගිය 09 වෙනි දිනයෙත් උද්ඝෝෂණ පැවැත්වුණු අතර ඒ සඳහා මා ද සහභාගි වුණා. නමුත් කිසිදු අපරාධ සිද්දියක් වාර්තා නොවුණු අතර මාර්ග අවහිර වුවත් අපගේ මැදිහත් වීමෙන් ඒවා වළක්වාලීමට කටයුතු කළා. රත්නපුර දිස්ත්‍රික් සමබන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය එල්ලාවල මැතිතුමාගේ නිවස අසල දිවා කාලයේ අපිත් රැඳී සිටියා. නමුත් එදින ඇති වූ එම සිද්දියට දෙදහසක්, තුන්දහසක් පමණ පිරිසක් පැමිණි නිසා වළක්වාලීමට අපට හැකියාවක් ලැබුණේ නැහැ. උද්ඝෝෂණවල රැඳී සිටි නිසා අපට චෝදනා එල්ලවෙලා. නඩු දෙකක් පවරා තිබුණා. මේ සම්බන්ධ අධිකරණ කටයතු අද දිනත් සිදුවුණා. මෙමඟින් වැරදි මතයක් සමාජ ගතවුණා. උද්ඝෝෂණවල යෙදී සිටියත් මා පළමුව දේශපාලන කටයුතු සඳහා ඉදිරිපත් වුණේ අකිල මැතිතුමා සමඟයි. ඉන් පසුවයි මා හාණු මුණිප්‍රිය මැතිතුමා සමඟ දේශපාලන කටයුතු සඳහා ඉදිරිපත් වුණේ. එවන් දේශපාලන හිතවත්කම් ඇති මා කෙදිනකවත් එතුමාගේ නිවසට ගල්ගහන්න, ගිනිපෙළි දික් කරන්න යන්නේ නැහැ. නොවිය යුතු දේවල් සිදු වුණා. තමන් ජීවත් වන නිවසට ගල් ගැසීම, ගිනි තැබීම අනුමත කරන්නේ නැහැ. රත්නපුර දිස්ත්‍රික් සමබන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය එල්ලාවල මැතිතුමාට, බලංගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමාට, බලංගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාට සිදු වූ කඩාකප්පල්කාරී ක්‍රියාව සම්බන්ධයෙන් මන්ත්‍රීවරයෙක් ලෙස කණගාටුව ප්‍රකාශ කරනවා. ගරු සභාපතිතුමනි, ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මෙවැනි සිද්දියක් සිදු වුවානම් එය සභා බල ප්‍රදේශයට කළු පැල්ලමක්. කුමන දේශපාලන මතිමතාන්තර දැරුවත් ඔබතුමා දැනුවත් වුවත් නැතත් ඔබතුමාට යම් ගැටළුවක් වූවොත් එය වළක්වාලීමට පැමිණීමට මා තරුණ කණ්ඩයමක් සමඟ සූදානමින් සිටියා. බලංගොඩ නගරයෙදි එම ක්‍රියාව මැඩපැවැත්වීමට ඉදිරිපත් වූවත් එහි පැමිණි ජනතාවට එහේව ක්‍රියාකර එය වළක්වාලීමට හැකියාවක් ලැබුණේ නැහැ. විපක්ෂ මන්ත්‍රීවරු ලෙස ආණ්ඩුවේ ජන පීඩනය වෙනුවෙන් ඕනෑම අවස්ථාවකදී ගිනි නොතියන ගල් නොගසන සාමකාමීව උද්ඝෝෂන වලට සහභාගී වෙනවා. සාමකාමී අරගලකරුවන් සේ පෙනී සිටිනවා. එය අපේ අයිතියයි. ආණ්ඩුවේ ක්‍රියා කලාපයට විරෝධය ප්‍රකාශ කරනවා. ඉන් එහා ගිය දේශපාලන පළිගැනීම්, මඩ ගසාගැනීම් වලට පිරිසක් ක්රියාත්මක වුවත් බලංගොඩ පොලීසිය හරියට නීතිය ක්‍රියාත්මක කළේ නැහැ. පොලීසියට නතර කරන්න බැරි වූ දේ අපිට කරන්න හැකි වුණේ නැහැ. පළමු සිදුවීම, දෙවන සිදුවීම වාර්තා වීමත් සමඟ අනෙක් සිදුවීම් නවතා ගැනීමට නොහැකි වුණා. රටතුල ක්‍රියාත්මක වන නීතිය කොතැනකද දන්නේ නැහැ. එක් සිද්දියක් වුණාම අනෙක් සිද්දිය වළක්වාලීමට ක්‍රියාකරනවා දුටුවේ නැහැ. අධිකරණයේ නඩු කටයුත්තක් බල පැවැත්වෙන බැවින් මේ පිළිබඳව වැඩි දුරට කතා කරන්න කැමැති නැහැ. නීතිය තුලින් නිවැරදි දේ ඔප්පුවෙයි.

මන්ත්‍රීවරුන්ට හිමි ඉන්ධන දීමනාව වෙනුවෙන් සභාව මැදිහත් වී ඉන්ධන සපයා දීම පිළිබඳ නැවත වාරයක් අවධානය යොමු කරන්න. අමාරුවෙන් සියලු දෙනා පෝළිම් වල රැඳී සිටිනවා. මන්ත්‍රීවරුන්ට විරුද්ධව වැරදි මතයක් සමාජ ගත වීමට ඉඩ තිබෙනවා.
රටේ ආර්ථිකය කඩා වැටී තිබෙන අවස්ථාවේ ඒ වෙනුවෙන් අප සියලු දෙනා එකට ක්‍රියාත්මක විය යුතුයි. ගරු සභාපතිතුමනි ඔබතුමා සම්මානලාබී ගොවියෙක්. එම නිසා මුඩු ඉඩමක් තෝරාගෙන සභාවේ මන්ත්‍රීවරු ඒකරාශී වී ආදර්ශ ගොවිපොළක් ක්‍රියාත්මක කරමු. එම නිෂ්පාදන වෙළඳපොලට යොමු කරමු.
සමනලවැව ජලාශයට යටවුණු කුඹුරු තරුණයන් විසින් වගා කිරීමට පටන්ගෙන. හොඳ ආරම්භයක් ලෙස මා දකිනවා. ඔවුන්ට සභාවේ සහයෝගය ලබා දෙමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,
සමනලවැව ජලශයට යටවුණු කුඹුරු ඉඩම් නැවත වගා කිරීම පිළිබඳ විරෝධතාවයක් නැති බව විදුලි ඉංජිනේරුවරයා දැනුම් දුන්නා. එහෙත් එම ඉඩම්වල ස්ථිර ගොඩනැගිලි ඉදි කිරීමට පියවර නොගන්නා ලෙස දැනුවත් කරන ලෙසට දැනුම් දුන්නා.
සුරංග මැතිතුමා ප්‍රකාශ කල පරිදි මන්ත්‍රීවරුන්ට සභාව මඟින් ඉන්ධන ලබා දීම සුදුසු නැහැ. අපිත් ජනතාව මෙන්ම පෝළිම්වල සිට ඉන්ධන ලබා ගනිමු. නැතහොත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ මෙන්ම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ද ජනතා වෛරය එල්ල විය හැකිය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දැක්වීම අනුව,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ කාබනික පොහොර මිලදී ගැනීමෙන් අනතුරුව ලංකාව පුරා විහිදී ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත පොහොර බෙදා හරින ක්‍රමවේදයත් පවතිනු ඇතැයි මාගේ විශ්වාසයයි. එබැවින් සභාවේ කසල අංගනය විසින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර මිලදී ගැනීමෙන් අනතුරුව, එම පොහොර ප්‍රදේශයේ ගොවි ජනතාව වෙත බෙදා හැරීමට හැකියාවක් පවතී ද යන්න විමසා බැලීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා අදහස් දැක්වීම අනුව,
මේ දිනවල සභාවට ලැබුණු ලිපිවල උඩවෙල වෙද මාර්ගයේ ඉවුර කඩා වැටීම පිළිබඳව ලිපියක් තිබුණේ නැහැ. එම නිසා එම ලිපිය පිළිබඳවත් ඒ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ගය පිළිබඳවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස ලේකම්තුමියට උපදෙස් ලබා දෙනවා.
පඹදෙණිය පාලම ප්‍රතිසංස්කරණය කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා සහ ඡන්ද අපේක්ෂිකාවක් වූ දුලානි මහත්මිය ඉල්ලීම කළා. ඒ අනුව පාලම සකස් කිරීමේ දී ගම්වාසීන්ගේ ශ්‍රම දායකත්වයට සභාවේ සහයෝගය ලබා දීමට කටයුතු කළා.
කසල අංගනය නිරීක්ෂණය සඳහා සහභාගී වීම ගැන සතුටට පත් වන අතර, කසල අංගනය ආරම්භයේ දී වළකට කසල ගෙනත් දමා පිළිස්සුවත් වර්තමානයේ දී එසේ නොකරන ලෙස සේවක මහත්වරුන් දැනුවත් කළා. වර්තමානය වන විට කසළ අංගනය යම් සංවර්ධනයක් සිදු වී ඇති අතර කාබනික පොහොර නිෂ්පාදනය කර අලෙවි කරනවා. මෙවැනි ස්ථානවල ඉබේ ගිනි හට ගන්නා අවස්ථාද පවතින බැවින් ඒ පිළිබඳව සොයා බැලීමටත්, සේවක මහත්වරුන්ට අවශ්‍ය උපදෙස් ලබා දීමටත් පියවර ගන්නවා.

එම අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා නැගී සිටිමින් එතුමා එම ස්ථානයේ රැඳී සිටින අවස්ථාවේ දීම ගිනි තැබීම් සිදු කල බව ප්‍රකාශ කරන ලදි.

ඉන් අනතුරුව ගරු සභාපතිතුමා නැවතත් අදහස් දක්වමින්,
එසේ සිදු වූයේ නම් කඩිනමින් එසේ නොකරන ලෙසට සේවකයන්ට උපදෙස් ලබා දීමට කටයුතු කරන ලෙස ලේකම්තුමියට උපදෙස් දෙන ලදි. පළාත් සභාවෙන් ප්ලාස්ටික් බෝතල් Baling Machine එකක් ලැබී ඇති බැවින් ඉදිරියේ දී නව තාක්ෂණය භාවිතා කරමින් කසළ අංගනය පවත්වාගෙන යාමට පියවර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
ගිවිසුම් අත්සන් කරන ලද සහ සංවර්ධනය කරමින් පැවැති මාර්ග අත්‍යාවශ්‍ය මාර්ග වුවත් සංවර්ධන කටයුතු අවසන් වී නැහැ. එහෙත් ඉදිරි වසර දෙක තුල රටේ සංවර්ධනයට අතිගරු ජනාධිපති, අගමැති ප්‍රමුඛ රජය ප්‍රමුඛත්වයක් ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු නොවන අතර නිශ්චිත වශයෙන් ඒ පිළිබඳව ප්‍රකාශ කල නොහැකියි. එහෙත් මෙම මාර්ග සංවර්ධනය කිරීම පිළිබඳව මහා මාර්ග අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට කටයුතු කරනවා. ප්‍රාදේශීය සභාවේ අයවැය මගින් ප්‍රතිප්‍රාදන වෙන් කලද ඉන්ධන හිඟය හේතුවෙන් දිනක් හැර දිනක් සභාවේ කසල රැස් කරනවා. වැය ශීර්ෂ වලට අදාල මුදල් මැයි මස වන විට අවසන් වීම ඊට හේතුවයි. උදාහරණයක් ලෙස ඉන්ධන මිල ඉහළ යාම නිසා වසරක් සඳහා වෙන් කරන ලද මුදල් පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් මැයි මාසය වන විට අවසන් වෙලා. මන්ත්‍රී දීමනා සහ සේවක වැටුප් ගෙවීම සඳහා පළාත් සභාවෙන් ප්‍රාදේශීය සභාවට අයවිය යුතු මුද්දර මුදල් පවා ගෙන්වා ගැනීමට පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා දැනුවත් කිරීමට පියවර ගත්තා.

මේ හේතූන් නිසා ඉදිරියේ දී දේශපාලන කටයුතු වල නිරතව සිටින සභාපතිවරු, මන්ත්‍රීවරුන්ට ගම්වාසීන්ට මුහුණ දීමේදී ගැටළු සහගත තත්ත්වයක් උදාකරයි. එසේ සිදු වී ඇත්තේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ, සභාපතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ වරදින් නොවෙයි. සභාපතිවරයාට පැවරී ඇති බලතල අනුව මමත් සිදුකලහැකි සේවය කලා. දේශපාලනඥයන් කලහැකි බලාපොරොත්තු පමණක් ඉදිරියේ දී ජනතාවට දිය යුතුයි. තව දුරටත් ජනතාවට බොරු පොරොන්දු නොදිය යුතු අතර මට එසේ කිරීමට හැකියාවක් නැහැ. ඉදිරියේ දී මම දේශපාලන කටයුතුවල නිරත් වුවත් නොවුවත් ජනතාවට ඇත්ත පවසා දේශපාලන කටයුතුවල නිරතවෙනවා. එසේ නොමැතිනම් දේශපාලන කටයුතුවල නිරත නොවී තම ඉඩකඩම්වල වගාකටයුතුවල නිරතවෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා අදහස් දැක්වීම අනුව,
වනඅලි ගම්වැදීම ලංකාවේ බොහෝ ප්‍රදේශවලට බලපාන ප්‍රශ්නයක්. මේ පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවටත්, එමගින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවටත් ඉදිරිපත් කළා. දිස්ත්‍රික් සමබන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය එල්ලාවල මැතිතුමාගේ මැදිහත්වීම මත මෙම ගැටලුව විසඳාලීම සඳහා දීර්ඝ කාලයක් සාකච්ඡා කලත් යෝජිත ක්‍රියාත්මක කිරීම් සඳහා පවතින දේශපාලන හා ආර්ථික අස්ථාවර භාවය බලපා තිබෙනවා. එහෙත් නැවත වාරයක් මේ පිළිබඳව දැනුවත් කිරිමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
පසුගියවර ඔබතුමාගේ මන්ත්‍රී දීමනාව පෙර පාසලේ අබලන් වූ උපකරණ අළුත්වැඩියා කිරිම සඳහා ලබා දුන්නා. ඒ සඳහා අවශ්‍ය වන ඉතිරි මුදල් සහා අරමුදල් යොදා එම කාර්ය අවසන් කරන ලෙස ලේකම්තුමියට උපදෙස් ලබාදුන්නා. එහෙත් ඒ සඳහා අවශ්‍යවන ඉතිරි මුදල ඔබතුමා ලබා දීමට පියවර ගන්නේනම් එම කටයුත්ත ඉතා කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවතින අතර, පරිත්‍යාග කිරීම වෙනුවෙන් ස්තූතිය පුද කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට, වතුසමාගම්වලට අයත් වගා නොකරන මුඩු බිම් සහිත ඉඩම් පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කලා.
වතු සමාගම්වලට ඉඩම් පවරා දී ඇතත්, මෙමගින් රටට වන හානිය පිළිබඳව සොයා බලා මෙම ඉඩම් රටේ සංවර්ධනයට යෙදවීමට පාලකයන් ක්‍රියා කල යුතුයි. මේ සඳහා හිටපු සෑම පාලකයෙක්ම වගකීම දැරිය යුතුයි. ගම්වාසීන්ට ප්‍රයෝජන ගන්නත් බෑ, වතු සමාගම් ඒවා සංවර්ධනය කරන්නෙත් නැහැ. සභා බල ප්‍රදේශයට අයත් නන්පේරියල් වතු සමාගම විසින් ඉදි කර ඇති ගේට්ටුව ඉවත් කිරීමට සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා දිස්ත්‍රික් ලේකම්තුමිය ක්‍රියා කළත් එම ගේට්ටුව ඉවත් කිරීමට නොහැකි වුණා. මෙම වතු සමාගම් වලට අයත් ඉඩම් වසර තුනක් වැනි කාලයකට නැවත අය කිරීමේ කාල සීමාවක් මගින් ණය මුදලක්

ලබා දී රටේ තරුණ තරුණියන් අතර බෙදා දී සංවර්ධනය කිරීමට කටයුතු කරන්නේනම් මෙමඟින් අපනයනය දියුණු කල හැකියි. එමෙන්ම තේ, පොල්, රබර් වැනි අපනයන බෝග වගාව සඳහා තරුණ තරුණියන් දිරිමත් කරන්නේනම් රට සංවර්ධනය කල හැකියි. මේ පිළිබඳව තරුණ තරුණියන් පෙළඹවීමක් සිදු නොකරනු ලබන අතර එහෙත් ඔවුන් විසින් කරනු ලබන සංවර්ධන ක්‍රියාකලාපයන්ට විරෝධතා දක්වන්නේ නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමියගේ අදහස් දැක්වීම අනුව,
ගම්වාසීන්ට සිදුවන වනසතුන්ගේ හානිය අවම කිරිම සඳහා සදාහරිත වැව්ලි සමාගමට අයත් ඉඩම් සංවර්ධනය කරන ලෙස එම සමාගම දැනුවත් කිරීමට කටයුතු කරනවා. ඒ සඳහා එම සමාගමේ ලිපිනය ලේකම්තුමිය වෙත භාර දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
වෙළඳ හිමියන් විසින් සහල් වැඩි මිලට පාරිභෝග ජනතාවට අලෙවි කිරීම අසාධාරණ වුවත් ඒවා තහනම් කිරීමට ප්‍රාදේශීය සභා පනතින් නීතිමය ප්‍රතිපාදන නැහැ. එහෙත් මේ පිළිබඳව පාරිභෝගික අධිකාරිය දැනුවත් කිරීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දැක්වීම අනුව,
කිංස්පාර්ක් ගම්මානයෙන් ආරම්භ වී උඩනළුවෙල කුඹල්මුල්ල මාර්ගය, හා උඩනළුවෙල යාය මාර්ගයේ සිට උඩගංගොඩතැන්න දක්වා දිවෙන මාර්ග අසලින් තෙකලා විදුලි රැහැන් පද්ධති මාර්ගය අසලින් ස්ථාපිත කර දෙන ලෙස විදුලි අධිකාරි දැනුවත් කිරීමට පියවර ගන්නවා.

ස.තො.ස. සමඟින් සිදු වූ සීනී වැඩි මිලට අලෙවි කිරීමේ අක්‍රමිකතාවය පිළිබඳ නිවැරදි තොරතුරු පවතීනම් ඔබතුමාගේ ලිඛිත ඉල්ලීම පරිදි ඒ පිළිබඳව වෙළඳ අමාත්‍යවරයා දැනුවත් කිරීමට පියවර ගන්නවා.
නාවල කුඹුරු යාය සඳහා අත්ට්‍රැක්ටරයක් රැගෙන යා හැකි පරිදි මාර්ගය සකසා ගැනීම සඳහා ඉඩම් අවසරය ලබා ගත යුතු බැවින්, මාර්ගය අවශ්‍ය ඉල්ලුම්කරුවන් මඟින් ඒ පිළිබඳ ඉල්ලීම් කරන්න. අනතුරුව ඒ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීමට පියවර ගන්නවා.
සමෘද්ධි දීමනාව ලබාදීමේ අක්‍රමිකතා සිදුව ඇත්නම් ඒ පිළිබඳව පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් වගකිව යුතුයි. නමගම් සහිතව තොරතුරු ලබා දෙන්න. එම තොරතුරු අනුව ප්‍රාදේශීය ලේකම් තුමිය දැනුවත් කිරීමට පියවර ගන්නවා.
ඉන්ධන ලබාගැනීමේ දී අප සියළු දෙනා අපහසුතාවයට පත් වෙලා. සභාවට ඉන්ධන මිලදී ගනු ලබන්නේ කිරිදිගල ඉන්ධන පිරවුම් හලෙනි. එහි ඉන්ධන නොමැති නම් සභාවට ඉන්ධන මිලදී ගැනීම ගැටළුවක් බැවින් ඒ පිළිබඳව කොමසාරිස්තුමා දැනුවත් කිරීමට කටයුතු කළා. අවශ්‍ය අයගේ ඉල්ලීම් පරිදි මන්ත්‍රී දීමනාවට සරිලන පරිදි මන්ත්‍රීවරුන්ට ඉන්ධන ලබා දීම පිළිබඳව සහකාර කොමසාරිස්තුමා දැනුවත් කර උපදෙස් ගැනීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
රටේ ආර්ථික අර්බුදය සමඟ සංවර්ධන කටයුතු තාවකාලිකව නවතා දමා තිබෙනවා. ඔබතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් එම සංවර්ධන කටයුතු සිදු කරන්න තිබුණා. ඔබතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී වලේබොඩ මැතිතුමාට දැනුවත් කල බවත් එහෙත් සංවර්ධනය සිදු නොවූ බවත් ප්‍රකාශ කළා. ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට කල නොහැකි වූ දේ නැවත සභාවට කරන්න වෙලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දැක්වීම අනුව ,
පසුගිය නමවෙනිදා සිද්දියේ දී විපක්ෂ මන්ත්‍රීවරුන් එම සිද්දිය හෙලාදැක්කා. එහිදී ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කිසිඳු සිද්දියක් වාර්තා නොවීම රටටම පූර්වාදර්ශයක් මෙන්ම විශාල ගෞරවයක්. ඔබතුමා මගේ ගේ ආරක්ෂාව සඳහා පැමිණීමට පෙළගැසී සිටි බව ප්‍රකාශ කළා. ඒ වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තුතිය ප්‍රකාශ කරනවා. ඔබතුමා එක් ස්ථානයක දී සභාවේ වැඩ කරනු ලබන සේවකයෙකු සමඟ සභාපතිතුමාගේ ගෙදරට පහර දෙන්න ඉඩ නොදෙන බව ප්‍රකාශ කර තිබුණා. මම මාගේ මුළු ජීවිත කාලය තුලදීම යම් ක්‍රමවේදයකට ආරක්ෂාව සපයා ගන්නවා. එහෙත් නමවෙනිදා සිද්දියේ දී ගම්වාසීන් මට ශක්තියක්

වුණා. පක්ෂ විපක්ෂ සියලු දෙනා එම අවස්ථාවේ දී මට සහයෝගය පල කළා. සහභාගී වුණා. මසක් ගත වුවත් චූදිතයන් අත්අඩංගුවට ගැනීමට නොහැකිවීම සම්බන්ධව මම නියෝජනය කරනු ආණ්ඩුවට විරෝධය ප්‍රකාශ කරනවා. මෙය ප්‍රකාශ කිරීමෙන් මට මගේ සභාපති ධූරය පවා අහිමි වීමට ඉඩ තිබෙනවා. එහෙත් ගොල්ෆේස් අරගලයට පහර දීමත් ගෙවල්, ගිනි තැබීමත් යන කාරණා දෙකම හෙළා දකිනවා. ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක නොවීම පිළිබඳව විරෝධය ප්‍රකාශ කරනවා. එම පරීක්ෂණ අපක්ෂපාතීව, පෞද්ගලික එදිරිවාදිකම් වලින් තොරව සිදු විය යුතුයි. දේශපාලනය කිරීම නිසා හේතුවෙන් අහේ පතේ සව් ශක්තියට නිවස ආරක්ෂා කර ගැනීමට සිදු වුණානම් එය එතරම් හොඳ නැහැ. අද දින මට මුහුණ දීමට සුදු වූ ඛේදවාචකයට හෙට දින ඔබට මුහුණ දෙන්න සිදුවෙයි. එම නිසා මෙතනින් මෙම සිදුවීම් නතර වියයුතුයි. රටේ ජනතාවට නීතිය පිළිබඳ විශ්වාසය ඇති වියයුතුයි. දේශපාලන මතිමතාන්තර කුමක් වුවත් එ්වා හෙටටත් තියෙයි. එහෙත් පක්ෂ විපක්ෂ කාටවත් මේවා සිදු නොවිය යුතුයි. වචනයකින්වත් ඉඹුල්පේට කරදරයක් සිදු වුණේ නැහැ. එය ඉඹුල්පෙට ගෞරවයක්. විපක්ෂයේ සියලු දෙනාට මාගේ ගෞරවය පිරිනමනවා.
සභාව මඟින් ඉන්ධන ලබා දීමේ දී අනවශ්‍ය ප්‍රශ්න උද්ගත විය හැකි බැවින්, ඒ සඳහා පිළිබඳව මන්ත්‍රීවරුන්ගේ ලිඛිත ඉල්ලීම පරිදි කොමසාරිස්තුමා දැනුවත් කිරිමට පියවර ගන්නවා.
රටට පූර්වාදර්ශයක් ලබා දීම සඳහා සභාවේ පාලනය යටතේ ආදර්ශ ගොවිපොළක් පවත්වාගෙන යාම සඳහා අයිතිය නොළඹෙන ආකාරයට දෙනගම වත්ත ප්‍රදේශයෙන් ඉඩම් කොටස් ලබා දෙන ලෙසට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා මඟින් ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කිරීමට පියවර ගන්නවා.

(09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.
ඊළඟ සභා වාරය ජූලි මස 12 වන අඟහරුවාදා දින පැවැත්වීමට කටයුතු කරනවා.

(10). ස්තූති කතාව හා අවසානය.
හත්වන සභාවේ පනස් දෙවන සභාව සඳහා පැමිණි ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමි. ඉදිරියේ පැමිණෙන දුෂ්කර කාල පරිච්ඡේදයට පක්ෂ විපක්ෂ සියලු දෙනා භේදයකින් තොරව සාර්ථකව මුහුණ දීමට ශක්තිය ධෛර්ය ප්‍රාර්ථනා කරමි.
ඉන් අනතුරුව, පෙ.ව. 11.55 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.